**ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් ගිණුම් නියමයන්**

**1. හැඳින්වීම**

1.1. සම්මත නියමයන් මෙම ගිණුම් නියමයන් තුළට අන්තර්ගතකර ඇත.

**අර්ථනිරූපන**

2. භාවිත කරන ලද, එහෙත් මෙම ගිණුම් නියමයන් හි අර්ථනිරූපනය නොකරන ලද උපයෝජන නියමයන් සඳහා සම්මත නියමයන් හි නිශ්චිතව දක්වා ඇති අර්ථයන් ම ඇත්තේය.

"**ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත**" යන්නෙන්, ගිණුමක් විවෘත කිරීම සඳහා ඔබ විසින් අත්සන් තබනු ලබන අපගේ අයදුම්පත අදහස් වේ.

"**මුදල් තැන්පතුව**" යන්නෙන්, මුදල් හෝ ඉලෙක්ට්‍රොනික පැවරුමක් මඟින් කරනු ලබන යම් තැන්පත් කිරීමක් අදහස් වේ.

"**එකතු කරගැනීම**" යන්නෙන්, යම් මූල්‍ය නොවන තැන්පතුවක් සඳහා යම් අදාළ චෙක්පත් ලියන්නකුගෙන්/ගෙවන්නෙකුගෙන් ලැබෙන නිශ්කාශනය වූ සහ කොන්දේසි විරහිත අරමුදල්වල ඇති යම් ගෙවීමක් අප විසින් ලබාගැනීමේ හෝ ලබාගැනීමට උත්සාහ කිරීමේ ක්‍රියාවලිය අදහස් වන අතර, "**රැස්කර ගැනීම**"යන්නට ඊට අනුරූප අර්ථය ඇත්තේ ය.

"**තැන්පතුව**" යන්නෙන්, යම් ගිණුමක් සඳහා ඔබ විසින් හෝ ඔබ වෙනුවෙන් කරන ලද මුදල් තැන්පතුවක් අදහස් වේ.

"**ප්‍රධාන ගිණුම (Master Account)**" යන්නෙන්, මුදල් බැර කිරීමට නියමිත වූ, ඔබ විසින් සකස්කරන ලද ගිණුම් අංක සහිත ගිණුමක් අදහස් වේ.

"**මූල්‍ය නොවන තැන්පතුවක්**" යන්නෙන්, මුදල් හෝ ඉලෙක්ට්‍රොනික පැවරීම මඟින් සිදු නොවන්නා වූ යම් තැන්පතුවක් අදහස් වේ.

"**සකස් කරන ලද ගිණුම් අංක**" යන්නෙන්, ඔබගේ ගෙවීම්කරුවන් සඳහා සකස්කිරීම පිණිස අප විසින් ඔබට ලබාදෙන යම් සකස් කරන ලද ගිණුම් අංකයක් අදහස් වේ.

"**මුදල් ආපසු ගැනීම්**" යන්නෙන්, යම් ගිණුමකින් ඔබ විසින් හෝ ඔබ වෙනුවෙන් කරන ලද යම් මුදල් ආපසු ගැනීමක් හෝ පැවරීමක් අදහස් වේ.

**3. <u>තැන්පතු</u>**

**3.1. <u>මුදල් තැන්පතු :</u>**

යම් මුදල් තැන්පතුවකට සමාන මුදලක් අප විසින් අදාළ ගිණුමට බැරකරනු ලැබේ. ගිණුමකට බැරකිරීම සඳහා පවසන ඕනෑම මුදලක් එම ගිණුම පිහිටි සේවා සපයන ස්ථානයේ දී පමණක් නැවත ගෙවනු ලැබේ.

3.2. **<u>මූල්‍ය නොවන තැන්පතු :</u>**

මූල්‍ය නොවන තැන්පතුවක ඇති මුදල එකතුකර ගැනීම සඳහා අප වෙත ඉදිරිපත් කිරීමේ දී ගිණුමට බැරකරනු ලබන නමුත් අප විසින් අන්‍යාකාරයකින් අවසර ලබා දී ඇත්නම් මිස අප වෙත සම්පූර්ණ සහ අවසාන ගෙවීම ලැබීමට පෙරාතුව එසේ බැරවී ඇති මුදල ආපසු ලබාගැනීම හෝ මාරුකිරීම සඳහා ඔබට හිමිකමක් නොමැත.

3.3. **<u>මුදල් බැරකිරීම :</u>**

අප වෙත ගෙවීම් ලැබී තිබුණද, නොතිබුණද, එය නොසලකා (අප විසින් නිශ්චිතව දක්වනු ලබන ආකාරයට) යම් සීමාවක් දක්වා වු මූල්‍ය නොවන තැන්පතු සඳහා අපගේ පරම අභිමතය පරිදි අප විසින් වහාම මුදල් බැරකිරීම සිදුකරනු ලැබීය හැකි ය.

3.4. **<u>නිශ්කාශනය නොවූ තැන්පතු :</u>**

නිශ්කාශනය නොවී ලැබී ඇති යම් මුල්‍ය නොවන තැන්පතු වටිනාකමක් ඔබගේ ගිණුමට බැරකිරීම අප විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවක දී, එකී මුල්‍ය නොවන තැන්පතුව අප විසින් ඔබට ආපසු යැවීම හෝ ඔබ විසින් ඉල්ලා සිටියහොත් අප විසින් එම මූල්‍ය නොවන තැන්පතුව භාරගැනීම සඳහා නැවත ඉදිරිපත් කිරීම කරනු ලැබේ.

3.5. **<u>ඔබගේ ගිණුම් හරකිරීම :</u>**

දින 14ක් ඇතුළත (හෝ වෙනත් යම් එකඟ වු කාලයක් ඇතුළත) අප වෙත කිසිම වටිනාකමක් ලැබී නොමැති අවස්ථාවක දී යම් මූල්‍ය නොවන තැන්පතුවක් නොගෙවන ලද ලෙස අප විසින් සලකනු ලැබේ. (අදාළ වේ නම්, යම් හුවමාරු අනුපාතිකවල වෙනස්කම් ද ඇතුළුව) දරන ලද සියලු වියදම් ඔබගේ ගිණුමෙන් අය කරනු ලැබේ.

3.6. **<u>තැන්පතු පත්‍රිකාව :</u>**

යම් මූල්‍ය නොවන තැන්පතුවක් සමග වූ තැන්පතු පත්‍රිකාව වැරදි හෝ අත්හැරීම් සිදුවී ඇති අවස්ථාවක දී, අප විසින් එම තැන්පතු පත්‍රිකාව සංශෝධනය කරනු ලැබිය හැකි ය. අප විසින් එසේ සංශෝධනය කරන ලද තැන්පතු පත්‍රිකා පිටපත සියලු කාර්යය සඳහා තීරණාත්මක වන්නේ ය.

3.7. **<u>සෘජු හර කිරීම් එකතුකිරීමේ සේවාව :</u>**

අප සමඟ ඔබ විසින් නම් කර ඇති යම් ගිණුමක බැරට සෘජු හර කිරීමක් හෝ වෙනත් යම් උචිත නිශ්කාශන පද්ධතියක් හරහා ස්වකිය ගිණුම් හර කිරීම සඳහා සහ ඉන් පසු හර වී ඇති මුදල පැවරීම සඳහා ස්වකීය බැංකුකරුවන් වෙත යථා පරිදි බලය ලබා දී ඇති සහ උපදෙස්

දී ඇති තැනැත්තන්ගෙන් ඔබ විසින් ගෙවීම් ඉල්ලා සිටීමේ දී ඔබගේ උපදෙස් අනුව අප විසින් එම ඉල්ලීම් පිළිගැනීම සහ ඒ අනුව ක්‍රියාකිරීම කරනු ලැබේ.

3.8. **ඔබගේ තැන්පතු නියෝජනය :**

මූල්‍ය නොවන තැන්පතු සඳහා ඔබට පූර්ණ නෛතික හිමිකමක් ඇති බවටත් මූල්‍ය නොවන තැන්පතුවල සඳහන් වන අත්සන්, පිටසන්කිරීම් සහ විස්තරවල විශ්වසනීයත්වය, වලංගුභාවය සහ නිවැරදිභාවය පිළිබඳ ඔබ විසින් සම්පූර්ණ වගකීම් භාරගනු ලබන බවටත්, ඔබ විසින් නියෝජනය කර පොරොන්දු වී සිටිනු ලැබේ.

3.9. **බැහැර කිරීම :**

සම්මත නියමයන් හි වගකීම සීමාසහිතවීමේ වගන්තිය අගතිවිරහිතව, යම් අනුරූප බැංකුවක හෝ අපගේ නියෝජිතයෙකුගේ අතපසු කිරීමක්, සොරකමක් හෝ හිතාමතා කරන ලද සාවද්‍ය ක්‍රියාවක් හෝ බංකොලොත්භාවය හේතුවෙන් ඇති වන යම් පාඩුවක් පිළිබඳව අප විසින් වගකියනු නොලැබේ.

3.10. **වෙනත් බැංකු ගාස්තු :**

යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් ඔබ වෙනුවෙන් හෝ අප වෙනුවෙන් යම් බැංකුවක් විසින් පනවන ලද ගාස්තු ඔබ විසින් ගෙවනු ලැබිය යුතු ය.

3.11. **හිමිකම ප්‍රදානය නොකළ හැකි බව :**

ගිණුමක දරනු ලබන සියලු බැරකම් ශේෂවල අයිතිකරු වශයෙන් ඔබ අඛණ්ඩව සිටිය යුතු අතර, ඔබ විසින් වෙනත් යම් තුන්වන පාර්ශ්වයක් වෙත අයිතිවාසිකම්, ඇපකර හෝ වෙනත් කිසිදු හිමිකමක් ප්‍රදානය නොකළ යුතු ය.

4. **මුදල් ආපසු ලබාගැනීම**

4.1. **මුදල් ආපසු ලබාගැනීම :**

(අ) මුදල් ආපසු ගැනීම සඳහා ප්‍රමාණවත් අරමුදල් ගිණුමෙහි පවතින අවස්ථාවක දී,

(ආ) ඔබගේ ගෙවීම් අයිතමය ලියා අත්සන්කර අපගේ නියමිත ආකෘති යථා පරිදි සම්පූර්ණ කර ඇති අවස්ථාවක දී, සහ

(ඇ) ගිණුම පවත්වාගෙන යනු ලබන සේවා ස්ථානයේ දී මුදල් ආපසු ලබාගැනීම සඳහා ඉල්ලීම කරනු ලබන අවස්ථාවක දී,

ගිණුමකින් මුදල් ආපසු ලබාගැනීම සඳහා අප විසින් අවසර දෙනු ලැබේ.

**4.2. චෙක්පත් ගෙවීම් නතර කිරීම :**

ඔබගේ ගිණුම සම්බන්ධයෙන් ඔබ විසින් ලියා ඇති යම් චෙක්පතක් අප ලවා අගරු කිරීමට ඔබට අවශ්‍ය වේ නම්, ඒ පිළිබඳව ඔබ විසින් ලිඛිතව අප වෙත දැනුම් දී අදාළ සියලු තොරතුරු සැපයිය යුතු ය. ඔබගේ ගනුදෙනුව නතර කිරීමට හෝ අවලංගු කිරීමට අප උත්සාහ කරනු ඇති අතර, එසේ කළ නොහැකි වුවහොත් ඒ පිළිබඳව අප විසින් වගකියනු නොලැබේ (චෙක්පත ගෙවීම කළ බැංකුව ද ඇතුළුව).

**5. අයිරා පහසුකම්**

**5.1. අවසර නොලත් අයිරා පහසුකම් භාවිතා නොකළ යුතු බව :**

ඔබගේ ගිණුමෙන් වැඩිපුර මුදල් ආපසු ලබා නොගත යුතු ය. ඔබට අයිරා පහසුකම් සීමාවක් ඇත්නම්, ඔබ විසින් එම සීමාව නොඉක්මවිය යුතු ය.

**5.2. අයිරා පහසුකම් ඉල්ලා සිටීම :**

යම් ගිණුමක් සඳහා අප විසින් අනුමත කරනු ලබන අයිරා පහසුකම්, අතිරේක නියමයන්ට යටත්විය හැකි ය. ඕනෑම අවස්ථාවක දී අයිරා පහසුකම් සීමාව අවලංගු කරනු ලැබිය හැකි ය.

**5.3. ස්වයංක්‍රීය අයිරා පහසුකම් :**

ඔබට දැනුම්දීමකින් තොරව ඔබගේ ගිණුමෙන් වැඩිපුර මුදල් ලබාගැනීම සඳහා අප විසින් අවසර ලබා දෙන අවස්ථාවක දී, අයිරා පහසුකම් පිළිබඳ මෙම වගන්තිය අදාළ වන්නේ ය.

**5.4. ඉල්ලා සිටීමේ දී ආපසු ගෙවීම් :**

ගිණුමේ පවතින ඕනෑම හර ශේෂයක් අප විසින් ඉල්ලූ විට ඔබ විසින් නැවත අපට ගෙවිය යුතුය.

**5.5. පොළිය :**

සියලු අයිරා පහසුකම් මත අප විසින් ඔබගෙන් පොළියක් අයකරනු ලැබේ. සේවා මධ්‍යස්ථානයේ අපගේ සාමාන්‍ය ක්‍රමවේදය ප්‍රකාරව කලින් කල ගණනය කරනු ලැබ ඔබ වෙත අප විසින් දැනුම් දෙනු ලබන දිනපතා පදනමක් මත පොළිය උපචිත වේ.

**6. ගිණුම් විස්තර**

**6.1. කාලසීමාව හා ක්‍රමවේදය :**

සේවා මධ්‍යස්ථානයේ අපගේ සාමාන්‍ය ක්‍රමවේදයට අනුකූලව අප විසින් ඔබට ගිණුම් ප්‍රකාශන සහ උපදෙස් එවනු ලැබේ.

**6.2. ගිණුම් තොරතුරු විමසා බැලීම :**

ඔබ විසින් ඔබගේ ගිණුම් ප්‍රකාශන, තහවුරු කිරීම් සහ උපදෙස් පරීක්ෂා කර බැලීම කළ යුතු ය.  යම් වැරදීමක් පිළිබඳ ලේඛනයේ සඳහන් දින සිට දින 30 ක් ඇතුළත ඔබ විසින් අප වෙත ලිඛිතව දැනුම්දිය යුතු ය.

**7. බැර ශේෂය මත පොළිය**

අප විසින් ප්‍රකාශිතව එකග වී ඇති අවස්ථාවල දී ඔබගේ ගිණුමේ බැර ශේෂය මත අප විසින් ඔබට පොළී මුදලක් ගෙවනු ලැබේ.  අප විසින් ගෙවනු ලැබිය යුතු පොළී මුදල අප විසින් ඔබට නිවේදනය කරනු ලබන යම් පොළී අනුපාතිකයක් යටතේ හෝ ඔබගේ ගිණුම පවතින ශාඛාවේ ප්‍රදර්ශනය කරනු ලබන ආකාරයට ඔබට ගෙවනු ලැබේ.

**8. ගෙවීම් සාධන පත්‍ර සඳහා වූ වගකීම**

**8.1. චෙක්පොත් :**

ඔබ වෙත එවන ලද චෙක්පොත් වෙනත් යම් තැනැත්තෙකු විසින් භාරගෙන හෝ භාවිත කරමින් සිටින්නේ වුවද ඔබ වෙත තැපැල් කරන ලද චෙක්පොත් පිළිබඳව ඔබ විසින් වගකියනු ලැබිය යුතු ය.

**8.2. ගෙවීම් සාධන පත්‍ර :**

සම්මත නියමයන් යටතේ අප විසින් වගකියනු ලැබිය යුතු අවස්ථාවක දී, අපගේ වගකීම ගෙවීම් සාධන පත්‍රයේ මතුපිට වටිනාකමට සීමා වන්නේ ය.

(අ) වෙනත් යම් තැනැත්තෙකු විසින් ගෙවීම් සාධන පත්‍රය එවනු ලැබුව නමුත් ඔබ විසින් එම සාධන පත්‍රය එවන ලද ලෙස පෙනී යන්නේ නම්, හෝ,

(ආ) ගෙවීම් සාධන පත්‍රයේ යම් වැරදීමක් තිබුණ ද, හෝ

(ඇ) ගෙවීම් සාධන පත්‍රය යැවීමේ හෝ ලැබීමේ ප්‍රමාදයන් තිබුණ ද,

අප විසින් ගෙවීම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී අප විසින් දරන ලද යම් පාඩුවක් සඳහා අප විසින් ඉල්ලා සිටීමේ දී අපව හානිපූරණයකර තැබීම සඳහා ඔබ විසින් වගකියනු ලැබිය යුතු මෙන් ම ඒ සඳහා එකඟ විය යුතු ය.

**9. සකස් කරන ලද ගිණුම් අංක**

**9.1. සකස් කරන ලද ගිණුම් අංක සැපයීම :**

ඔබගේ ඉල්ලීමකට අනුව අප විසින් ඔබට ප්‍රධාන ගිණුමට සම්බන්ධ කර ඇති සකස් කරන ලද ගිණුම් අංක සපයනු ලැබිය හැකි ය.

**9.2. ප්‍රධාන ගිණුමට බැර කරන ලද තැන්පතු :**

සකස් කරන ලද ගිණුම් අංක වෙත කරනු ලබන තැන්පත් කිරීම් අදාළ ප්‍රධාන ගිණුම වෙත ස්වයංක්‍රීයව බැර වන්නේ ය.

**9.3. ගිණුම් ප්‍රකාශ :**

ඔබගේ සකස් කරන ලද ගිණුම් අංකයට අදාළව කරන ලද තැන්පතු පෙන්නුම් කරන ගිණුම් ප්‍රකාශනයන් අප විසින් ඔබ වෙත එවනු ලැබේ.

**9.4. ප්‍රධාන ගිණුම වෙනස්වීම :**

ප්‍රධාන ගිණුමක් වෙනස් කිරීම සඳහා ඔබ අපේක්ෂා කරන්නේ නම්, ඒ පිළිබඳ ඔබ විසින් ලිඛිතව අප වෙත දැන්විය යුතු ය. එවැනි දැන්වීමක් අනුව ක්‍රියා කිරීම සඳහා ඔබ විසින් අපට සාධාරණ කාලයක් ලබා දිය යුතු ය.

**10. අත්හිටුවීම, වසා දැමීම සහ අවසන් කිරීම**

**10.1. ගිණුම් වසා දැමීම :**

(අ) ඕනෑම අවස්ථාවක දී අප විසින් ඔබගේ ගිණුම වසා දැමීම හෝ අත්හිටුවීම හෝ කරනු ලැබිය හැකි අතර, අපට හැකි ඉක්මනින් ඒ පිළිබඳව ඔබව දැනුවත් කළ හැකි ය.

(ආ) ඔබගේ ලිඛිත නිවේදනය ලැබුණු පසුව, අප විසින් ඔබගේ ගිණුම වසා දමනු ලබන අතර, ඔබ විසින් අපට ගෙවිය යුතු මුදල් අඩු කිරීමෙන් පසුව ඔබගේ ගිණුමේ පවතින යම් බැර ශේෂයක් ඇත්නම්, එම බැර ශේෂය අප විසින් ඔබට ගෙවනු ලැබේ.

**10.2. ගිවිසුම අවසන් කිරීම :**

ඔබගේ සියලු ගිණුම් අවසන් කිරීමෙන් පසුව සම්මත නියමයන් යටතේ පවත්නා විධි විධානවලට හැර මෙම ගිවිසුම තවදුරටත් බලාත්මක නොවන්නේ ය. ගිණුම් අවසන් කිරීමේ දිනයේ දී හෝ ඊට පෙර උපචිත වූ යම් අයිතිවාසිකම් හෝ බැඳීම් තවදුරටත් බලාත්මකව පවතී.

**10.3. ගිණුම අවසන් කිරිමෙන් පසුව කරනු ලබන ගෙවීම් :**

ඔබගේ ගිණුම අවසන් කිරීමෙන් පසුව ද අප විසින් මුදල් ආපසු ලබාගැනීම සඳහා කටයුතු කර ඇත්නම්, අප විසින් ඉල්ලා විටක දී එම මුදල අප වෙත ගෙවීම සඳහා ඔබ එකඟව සිටිනු ලැබේ.

**10.4. හිමිකම් නොපාසිටින බැර ශේෂයන් :**

යම් වසා දමන ලද හෝ අත්හිටුවන ලද ගිණුමක හෝ අකර්මන්‍ය වශයෙන් අප විසින් නම් කරන ලද ගිණුමක පවතින හිමිකම් නොපාන ලද බැර ශේෂයක් සඳහා අප විසින් ඔබට කිසිම පොළී මුදලක් ගෙවනු නොලැබේ.

**10.5. ගිණුම පරිවර්තනය කිරීම :**

එක් වර්ගයක ගිණුමක් තවත් වර්ගයක ගිණුමක් බවට අප විසින් පරිවර්තනය කරනු ලබන අවස්ථාවක දී, ඒ පිළිබඳව අප විසින් ඔබට නිවේදනය කරනු ලැබේ.

**11. අනනුකූලතාවය**

(අ) මෙම ගිණුම් නියමයන් සහ ගිණුම් විවෘත කිරීමේ ඉල්ලුම් පත්‍රය අතර, යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට දැනට පවත්නා ගිණුම් නියමයන් බලාත්මක වේ, සහ

(ආ) මෙම ගිණුම් නියමයන් සහ දේශීය උපකාරක නියමයන් අතර යම් අනනුකූලතාවයක පැවතියහොත් එවිට දේශීය උපකාරක නියමයන් බලාත්මක වේ.

මෙහි සිංහල හා ඉංග්‍රීසී පාඨ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට ඉංග්‍රිසි භාෂා පාඨය බලපැවැත්විය යුතුය.